**ශීර්ෂය 276- බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව- 2013 වර්ෂය**
**---------------------------------------------------------**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ කාර්යයන්

**---------------------------------------------**

(අ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වූ අනුබද්ධ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිව කටයුතු කිරීම.

(ආ) රජයේ සියළු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යමින් පැවරෙන කටයුතු ඉටු කිරීම.

(ඇ) රජය හා පළාත් සභාව විසින් පවරා ඇති කටයුතු වෙනුවෙන් ආදායම් එකතු කිරීම.

(ඇ) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා පරිපාලනය සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම.

(ඉ) පළාත් සභාවට අදාල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඊ) මැතිවරණ පැවැත්වීමට අදාල සියළු කටයුතු සිදු කිරීම.

(උ) විමධ්‍යගත අයවැය වැඩසටහන ඇතුළුව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් පවරන ප්‍රතිපාදන යටතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(ඌ) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ඇතුළු විවිධ විෂයන් සඳහා සම්බන්ධීකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාල කටයුතු පවත්වාගෙන යාම.

(එ) දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය, ආගමික හා සංස්කෘතික ආදි උත්සව සංවිධානය කිරීම.

(ඒ) සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් ජනතාව හා රාජ්‍ය ආයතන කටයුතු අතර සම්බන්ධීකරණය සඳහා දායකවීම හා පොදු සමාජයීය කාරණා නිරාකරණය සඳහා මැදිහත්ව කටයුතු කිරීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) මහියංගණය
(ආ) රිදීමාලියද්ද
(ඇ) කන්දකැටිය
(ඈ) මීගහකිවුල
(ඉ) සොරණාතොට
(ඊ) බදුල්ල
(උ) පස්සර
(ඌ) ලුණුගල
(එ) හාලිඇල
(ඒ) ඇල්ල
(ඔ) බණ්ඩාරවෙල
(ඕ) හපුතලේ
(ක) හල්දුම්මුල්ල
(ග) වැලිමඩ
(ජ) ඌවපරණගම

## 1.3 විගණන විෂය පථය

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජූනි 10 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.5 සිට 1.15 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විසර්ජන ගිණුම

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.532,813,919 ක් වූ අතර වර්ෂය අවසාන වනවිට ඉන් රු.517,274,215 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 15,539,704 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.92 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර්31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 462,963,919 | 461,171,942 | 1,791,977 | 0.39 |
| මූලධන | 69,850,000 | 56,102,273 | 13,747,727 | 19.68 |
| එකතුව | 532,813,919 | 517,274,215 | 15,539,704 | |

(ii) **අයවැය විචලනය**

-------------------

මූලධන වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු. මිලියන 9 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර තවත් මූලධන වැය විෂයයක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 66 ක් වී තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 23 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.3,303,889,541 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.1,661,292,557 ක් හා රු.1,488,557,074 ක් වශයෙන් එකතුව රු. 3,149,849,631 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.139,457,117 ක් හා රු.14,582,793 ක් වශයෙන් එකතුව රු.154,039,910 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරියන් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 7.74 ක් හා සියයට 0.97 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන එක් ගමකට එක් වැඩක් - ගම නැගුම වැඩසටහන හා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි.

  - මහපිටිය බකිණිදඩුගොල්ල මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඒබීසී ප්‍රවාහනය කර ඇතිරීම වෙනුවෙන් වර්ග මීටර් 43.85 ක් වැඩිපුර මිනුම් කීරීමෙන් රු.92,173ක මුදලක් කොන්ත්‍රාත්කාර සමිතියට වැඩිපුර ගෙවා තිබුණි.
  - පෙතියාගොඩ දිරියගම ප්‍රජාශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියේදී ගොඩනැගිල්ලේ වහලය ඉදිකිරීම හා දැවරාමු යොදා ගනිමින් දොරවල් සවිකිරීම සඳහා නියමිත ප්‍රමිතියෙන් යුත් දැව භාවිතා කර නොතිබුණි. මෙම ඉදිකිරීම් කටයුතු සඳහා රු.248,564 ක මුදලක් අදාල කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබුණි.
  - කෙසෙල්පොත උතුර අබලන්ව පවතින ග්‍රාම නිළධාරි කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේදී වහලය ඉදිකිරීම වෙනුවෙන් පැරණි ගොඩනැගිල්ලෙන් ඉවත් කළ දැව භාවිතා කර තිබූ අතර ඒ

වෙනුවෙන් රු.190,552 ක් ද ගඩොල් බිත්ති බැඳීමට හා දැවරාමු හා දොරවල් සවිකිරීමට පිළිවෙලින් රු.49,266 ක් හා රු.15,984 ක් ද කොන්ත්‍රාත්කාර සමිතියට වැඩිපුර ගෙවා තිබුණි.

- සියඹලාගස්ලන්ද, ගොංගොල්ල මාර්ගය සැකසීමේ ව්‍යාපෘතියේදී මුල් ඇස්තමේන්තුව අනුව ඉදිකළ යුතු බෝක්කු දෙකක් වෙනුවට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ ඉල්ලීමකට අනුව එක් බෝක්කුවක් පමණක් ඉදිකර අනෙක් බෝක්කුව ඉදිකිරීම වෙනුවට රු.532,232 ක පස්වැඩ කර තිබුණි.

- පිටමාරුව පාසලට යන මාර්ගයේ අවසාන මීටර් 19 ක ප්‍රමාණය කොන්ක්‍රීට් කිරීමේ දී නියමිත ප්‍රමිතියෙන් ඉදිකර නොතිබූ අතර ස්ථාන 03 කදි මාර්ගයේ පැලීම් නිරීක්ෂණය විය. මෙම මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කාර සමිතියට රු.604,610 ක් ගෙවා තිබුණි.

- රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2011 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ එක් තරුණයෙකුට රු.6,500 බැගින් තරුණයින් 64 දෙනෙකුට රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා රු.416,000 ක් ශ්‍රී ලංකා  ගමනාගමන මණ්ඩලයේ මහියංගනය ඩිපෝවට ගෙවා තිබුණි. ප්‍රදේශයේ රියදුරු බලපත්‍ර අවශ්‍ය තරුණයින් විධිමත් පරිදි හඳුනා නොගෙන පුහුණුව ලබාදීමට කටයුතු කිරීම නිසා පුහුණුව නිමකර බලපත්‍ර ලබාගෙන තිබුණු සංඛ්‍යාව 29  ක් වී තිබුණි. ඉතිරි 35 දෙනෙකු සඳහා රියදුරු පුහුණුව ලබාදීම වෙනුවෙන් ගෙවා තිබුණු රු. 227,500 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

-----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27601 | 43,000,000 | 37,548,375 | 31,500,000 | 38,778,145 | 155,000,000 | 122,530,367 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 27601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.5,337,256 ක් විය.

(ii) වැඩ තහනම් කර තිබුණු නිලධාරින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.519,104 ක් වූ අතර එම ණය ශේෂයෙන් රු.255,797 ක් වසර 05 කට වඩා පැරණි ශේෂයන් විය. ණය ශේෂ හා අදාල පොලිය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් තනතුරේ සේවයේ යෙදී සිට සේවය අතහැර ගිය හිටපු ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අයවිය යුතු දේපල, වාහන හා ආපදා ණය ශේෂය වූ රු.1,096,080 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණත් ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) මහියංගණය හිටපු ප්‍රාදේශීය ලේකම් 1999 ඔක්තෝබර් 31 දින බදුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් ලෙස ස්ථාන මාරුවීම් ලබා යන විට හිඟහිටව තිබූ රු.242,373 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.507,372,544 ක් විය. එම ශේෂ තුළ වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,718,790 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.6 වත්කම් කළමනාකරණය**

---------------------------

**ඌන උපයෝජිත වත්කම්**

----------------------------

සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2012 අගෝස්තු 25 දින සිට රියදුරු තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් සංචිත වාහනයක් ඌන උපයෝජිතව පැවතුණි.

**1.7 අනුකූල නොවීම**

------------------

**නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | - | ආයතන සංග්‍රහයට අදාලව වැටුපෙන් ප්‍රතිශතයක් වශයෙන් නිල නිවාස කුළිය අයකිරීම වෙනුවට දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියකින් තොරව 2006 වර්ෂයේ තක්සේරුව මත වූ ආර්ථික කුළිය ගණකාධිකාරි සහ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) නිල නිවසේ නිවාස කුළිය ලෙස අයකර තිබුණි. |
| XIX පරිච්ඡේදයේ 6 ඡේදය | - | රිදීමාලියද්ද හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවාස 03 ක අදාල දේපලවල භාරය නිසිපරිදි කොන්දේසි සහිතව ගිවිසුමක් අත්සන් කරවා ගෙන භාර දී නොතිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 1645(අ) | 529,461 | කන්දකැටිය, සොරණාතොට, වැලිමඩ හා ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන අලුත්වැඩියා වියදම් ඇතුළත් කර වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |

## 1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළයුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| සමගිපුර ඩීනිස්ලන්ඩ් පඩිපෙල සකස් කිරීම | 48,860 | 2013.09.18 | අදාල සමිතිය විසින් ඉටු කිරීම් කටයුතු ආරම්භ නොකිරීම |
| උඩුපුස්සැල්ලාව ගම්පහ වත්ත ඉහල කොටස ක්‍රීඩාංගණය මට්ටම් කිරීම හා වැට සකස් කිරීම සඳහා ද්‍රව්‍යාධාර ලබා දීම | 29,100 | - | යාබද ඉඩම් හිමියන් විරුද්ධත්වය පල කිරීම |

| | | | |
|---|---|---|---|
| හිඳගල වතු කොටසේ කලුගල සංස්කෘතික මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | 300,000 | - | මුලින් ප්‍රතිපාදන සළසා තිබුණ කිරින්ද උඩුවර ඉහල කොටසේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ යෝජනාව වෙනස් කිරීම හේතුවෙන් එම කොටසේ වතු ජනතාවගේ විරෝධය පැම |
| අරවාකුඹුර ශ්‍රී විජිත සම්බෝධි විහාරයේ සංඝවාසය ඉදි කිරීම | 100,000 | 2013.12.31 | අදාල කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගිවිසුම්ගතවීමට ලියාපදිංචි සමිතියක් ඉදිරිපත් නොවීම. |

**(ආ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිමකළ දිනය | **2013 දෙසැම්බර් 31** දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු. | | | | රු. | |
| **පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | | | |
| බ/කණවැරැල්ල අංක 1 විද්‍යාලයේ අඩුපාඩු සකස් කිරීම. | **500,000** | 2013.04.09 | 2013.06.06 | 2013.07.08 | 349,725 | අධික වර්ෂාව |
| බ/කණවැරැල්ල අංක 2 විද්‍යාලයේ 20’x20’ පංති කාමරයක් ඉදි කිරීම | **500,000** | 2013.04.09 | 2013.06.05 | 2013.06.26 | 300,883 | අයහපත් කාළගුණය හා ප්‍රවාහන අපහසුතා |
| බ/කණවැරැල්ල අංක 3 විද්‍යාලයේ අඩුපාඩු සකස් කිරීම. | **500,000** | **2013.04.05** | 2013.06.05 | 2013.07.15 | 490,620 | අයහපත් කාළගුණය |

**හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
-----------------------------------------

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වේල්ලේවෙල මැදමංකඩ මාර්ග සංවර්ධනය | **99,900** | 2013.07.30 | 2013.09.14 | 2013.09.26 | 99,864 | |
| වේවැල්හින්න වසමේ ඔතඹෙවත්තේ 11 කොටසේ කාර්යාල පාර කොන්ක්‍රීට් කිරීම | **52,757** | 2013.09.25 | 2013.10.16 | 2013.12.14 | 50,000 | |
| උඩුවර මුගුණුමත අම්පිටිකන්ද දක්වා මාර්ගයේ මුල් කොටස ප්‍රතිසංස්කරණය කිරීම | **71,956** | 2013.10.30 | 2013.11.20 | 2013.12.26 | 71,956 | ගිවිසුම්ගත සමිති විසින් කර්මාන්තය නිම කිරීම ප්‍රමාද කිරීම |
| හාලිඇල ජයතිලක මාවත පළමු අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **51,867** | 2013.09.10 | 2013.10.10 | 2013.10.24 | 50,000 | |

**වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
-----------------------------------------

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඌව බෙන්හෙඩ් වැලිමඩ කොටසේ ශ්‍රී සිත්තික විනායගර් ආලයම් සංස්කෘතික මධ්‍යස්ථානය සංවර්ධනය | **294,000** | 2013.12.09 | 2013.12.28 | - | 79,856 | ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී කොන්ක්‍රීට් සවි කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම |
| ඔහිය එල්ඩ් මාර්ගය කොන්ක්‍රීට් කිරීම | **1,000,000** | 2013.12.23 | 2012.12.31 | - | - | අයහපත් කාළගුණය |

**ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
----------------------------------------------

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කර්කිල්ස් බැකින්ටන් කොටස මාර්ගය කොන්ක්‍රිට් කිරීම | **1,000,000** | 2013.12.26 | 2013.12.31 | - | 306,344 | වර්ෂය අවසානයේ ප්‍රතිපාදන ලැබීම නිසා නිම කිරීමට කාලය නොමැති වීම |
| තුඹෙවත්ත වෝල්ඩ්මාර් කොටස සංස්කෘතික මාර්ගය සංවර්ධනය කිරීම | **300,000** | - | 2013.12.31 | - | - | |

**(ඇ) ඇස්තමේන්තු පිළියෙල කිරීම**
--------------------------------

2011 සැප්තැම්බර් 02 දිනැති අංක MED/RE දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2011 වර්ෂයේ සිට ගමනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල උපදෙස් මාලාවේ 4 ඡේදය ප්‍රකාරව ගමනැගුම වැඩසටහනට අදාල මුළු ඇස්තමේන්තුව මත සියයට 20 ට නොවැඩි ප්‍රමාණයක් නුපුහුණු ශ්‍රමය සඳහා අඩු කළ යුතු විය. එම විධිවිධාන නොසළකා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කොන්ත්‍රාත්කරුට ගෙවිය හැකි උපරිම මුදල මත සියයට 20 ට නොවැඩි ප්‍රමාණයක් නුපුහුණු ශ්‍රමය ලෙස තක්සේරු කිරීම නිසා යොදාගන්නා ලද නුපුහුණු ශ්‍රමය අඩුවෙන් තක්සේරු කර තිබුණි.

**(ඇ) ප්‍රමාද ගාස්තු අඩුවෙන් අය කිරීම**

----------------------------------

(i) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ගමනැගුම ව්‍යාපෘති 09 කින් අඩුකළ යුතු ප්‍රමාද ගාස්තු රු.65,828 ක් අයකර ගෙන නොතිබුණි.

(ii) 2012 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ එක් ගමකට එක් වැඩක් ව්‍යාපෘති 20 කින් ව්‍යාපෘති 11 ක් ගිවිසුම්ගත කාලසීමාව තුළ අවසන් කර නොතිබුණි. අවිධිමත් ආකාරයෙන් ගිවිසුම්ගත කාලසීමාව වෙනස් කර තිබීම නිසා අඩුකර ගත යුතු ප්‍රමාද ගාස්තු රු.177,625 ක් අයකර ගැනීම වැලකී තිබුණි.

**1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-------------------------------------

**ගැලපුම් කළයුතු ශේෂ**

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විශ්‍රහයට අනුව මාස 06 කට වැඩි වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවත ආ එකතුව රු.15,857 ක් වටිනා උපලබ්ධි නොවූ තැන්පතු පැවතුණි.

**1.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල වාහනය 2013 ජනවාරි සිට 2013 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ කිලෝ මීටර් 12,606 ක් ධාවනය කර තිබුණි. එම දුර ප්‍රමාණය සඳහා භාවිතා කළ යුතු ඉන්ධන ප්‍රමාණය ලීටර් 1,575.5 ක් වී තිබුණි. පරිභෝජනය කරන ලද ඉන්ධන ප්‍රමාණය ලීටර් 1,872.62 ක් වන බැවින් අවශ්‍ය ප්‍රමාණයට වඩා රු.36,040 ක් වටිනා ඉන්ධන ලීටර් 297.12 ක් වැඩිපුර පරිභෝජනය කර තිබුණි.

**1.11 අවිධිමත් ගනුදෙනු**

--------------------

2013 අප්‍රේල් 09 දින ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.634,250 ක් වටිනා මිලදී ගැනීම්වලට අදාලව සැපයුම්කරුවෙකු ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගත් බව සඳහන් කර එම සැපයුම්කරුගෙන් මිලදී ගැනීම කර තිබුණි. එම තීරණය ගත් ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ ප්‍රාදේශීය ලේකම්වරයා හා එහි සාමාජිකයෙකු වන තාක්ෂණ නිලධාරියා එදින පෙ.ව.8.00 සිට ප.ව.8.35 දක්වා ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වී තිබුණු බැවින් එදින ප්‍රසම්පාදන කමිටුවේ තීරණය සාවද්‍ය වී තිබුණි.

## 1.12 අනාර්ථික ගනුදෙනු

----------------------

රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ යෞවන සමාජ සඳහා අත්පන්දු ක්‍රීඩා පිටියක් සැකසීමට රු.50,000 ක මුදලක් වැය කර තිබූ අතර අත්පන්දු ක්‍රීඩා පිටිය ඉදිකළ ස්ථානයේ 2013 නොවැම්බර් 19 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අදාල ස්ථානයේ ක්‍රීඩා පිටියක් නොතිබූ අතර මහවැලි අධිකාරිය මගින් එම ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදි කරමින් පැවතුණි.

## 1.13 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී වූ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනයේ වේග මාපකය 2012 ජුනි 20 දින සිට අක්‍රීයව තිබුණද, එය අළුත්වැඩියා කිරීමට හෝ අළුතින් මාපකයක් සවි කිරීමට හෝ කටයුතු කර නොතිබීම නිසා දෛනික ධාවන සටහන්වල දක්වා ඇති ඉන්ධන ප්‍රමාණය සහ ධාවනය කළ කිලෝමීටර් සංඛ්‍යාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනයක සිදුකළ ඉන්ධන පරීක්ෂාව අනුව ඩීසල් ලීටරයකට ධාවනය කළ හැකි කිලෝමීටර් ගණන 8 ක් වුවත්, අදාල වාහනයේ දෛනික ධාවන සටහන් තුලනය කරනු ලබන්නේ ඩීසල් ලීටරයකට කිලෝමීටර් 07 ක් වශයෙනි. මේ අනුව 2013 ජනවාරි 08 දින සිට 2014 පෙබරවාරි 07 දින දක්වා ධාවනය කළ කිලෝමීටර් 16,044 ක් වෙනුවෙන් ඉන්ධන ලීටර් 286.5ක් සඳහා රු. 34,781 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 1.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 52 | 46 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 45 | 21 | 24 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1,006 | 758 | 252 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 139 | 118 | 31 | 10 |
| (v) | වෙනත් (අනියම්) | - | 23 | - | 23 |
| | | **1,242** | **966** | **313** | **37** |